# ඉතිහාසය

## 6 ශ්‍රේණිය

# 5. පාඩම

# අපේ අතීත රජවරු

## පණ්ඩුකාභය රජතුමා

පියා - දීඝගාමිණී කුමරු

මව - චිත්‍රා දේවිය

අධ්‍යාපනය ලැබුයේ පණ්ඩුල නම් බ්‍රාහ්මණයාගෙනි

විවාහ වූයේ ස්වර්ණපාලී කුමරිය සමග

පණ්ඩුවාසදේව රජුගේ සහ භද්දකච්චායනා දේවියගේ එකම දියණිය වූ චිත්‍රා කුමරියට අනාගතයේ පුතකු ඉපදුනහොත් යම් දිනක ඔහු සිය මාමාවරුන් එකොලොස්දෙනාම මරා අනාගතයේ රජබවට පත් වන බව රාජකීය දෛවඥයෝ අනාවැකි පල කලහ.

මේ බව දැනගත් වහාම චිත්‍රා කුමරියගේ සහෝදරවරු ඇයව එක්ටැම් ගෙයක සිර කරන ලදි.

දීඝගාමිණී කුමරු සහ චිත්‍රා දේවියට උපන් පුත්කුමරා චිත්තරාජ සහ කාලවේල යන දෙදෙනා විසින් දිවි කැපකොට ආරක්ෂා කලහ.

පසුකලෙක පණ්ඩුකාභය රජු නමින් සිරිලක සිංහල රාජාවලියේ ආරම්භක රජතුමා ලෙස මෙම කුමරු අභිශේක ලැබීය.

පාලන මධ්‍යස්ථානය වශයෙන් අනුරාධපුරය තෝරාගත් මෙතුමා විසින් සිදු කරන ලද කාර්යයන් පහත පරිදි ලැයිස්තුගත කල හැකිය.

- නගරයේ ආරක්ෂාවට දිය අගලක් නිර්මාණය කිරීම.
- දිශා හතරේ දොරටු හතරක් තැනවීම
- මාර්ග පද්ධතියක් පිහිටුවීම.
- උද්‍යාන පොකුණු ආදිය කරවීම

- නගරයේ කැලිකසල ඉවත් කිරීමට, වැසිකිලි පිරිසිදු කිරීමට, මළ සිරුරු ගෙන යාමට  සහ සොහොන් පිරිසිදු කිරීමට සේවකයන් ලත් කළේය.
- සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීමේ අරමුනින් රෝහලක් ඉදි කිරීම.
- ආගමික සහජීවනය ඇති කිරීමේ අරමුණින් දේවාල ගොඩ නැංවීම.
- විවිධ ආගම් අදහන අය සඳහා අවශ්‍ය සියලු පහසුකම් සපයා දීම.
- අභය වැව නමින පළමු වරට නගරය ආසන්නයේ වැවක් ඉදි කිරිම.

## පැවරුම්

1. පෙළපොතේ සඳහන් 5. 1 රූපයේ දැක්වෙන පරිදි පණ්ඩුකාභය රජු විසින් නිර්මාණය කරන ලද නගරයෙහි දක්නට ලැබෙන ලක්ෂණ මොනවාද?

2. පණ්ඩුකාභය රජුගේ ළමා කාලයේදී ඔහුට මුහුණ දීමට සිදුවූ අභියෝග මොනවාද?

3. පණ්ඩුකාභය රජුගේ ජීවන චරිතය තුළින් ඔබට ලබා ගත හැකි ආදර්ශ මොනවාද?